# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2373/51 - 2024 මාර්තු මස 01 වැනි සිකුරාදා - 2024.03.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### දකුණු පළාතේ පළාත් සභාව

දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමන් විසින් කරනු ලබන නිවේදනය

**262 අධිකාරය වන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66 ආ.(2) වගන්තිය යටතේ වන නියමය**

262 අධිකාරය වන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66 ආ.(2) වගන්තිය ප්‍රකාරව ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිළධාරිගේ අංක 2369/02 හා 2024.01.29 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් මල්ලියාවඩු නලින් චමින්ද ප්‍රියදර්ශණ යන අය තෝරාපත් කර ගත් බව ප්‍රකාශයට පත්කර ඇති අතර, එකී සභාපතිවරයා විසින් 2024 වර්ෂයට අදාළ ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ අයවැය ලේඛනය සභා සම්මත කර ගැනීම සඳහා 2024.02.21 දින සභාවට ඉදිරිපත් කර ඊට පක්ෂව ඡන්ද 13 ක් හා විපක්ෂව ඡන්ද 14ක් ලැබී අයවැය ලේඛනය පරාජයට පත් වී ඇති හෙයින්ද;

2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතේ 17 වන වගන්තියෙන් සංශෝධිත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 169 වන වගන්තිය ප්‍රකාරව, එකී අයවැය ලේඛනය දෙවන වරටත් නැවත 2024.02.28 දින සභාවට ඉදිරිපත් කර පක්ෂව ඡන්ද 12 ක් හා විපක්ෂව ඡන්ද 14 ක් ලැබී එකී අයවැය ලේඛනය පරාජයට පත් වී ඇති හෙයින්ද;

එකී සභාපතිවරයා 2024.02.28 දින තම ධූරයෙන් ඉල්ලා අස්වීම ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිළධාරි වෙත දන්වා ඇති හෙයින් ද;

262 අධිකාරය වන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66 ආ.(4) වගන්තියේ අතුරු විධානය ප්‍රකාරව ඇල්පිටිය ප්‍රාදේශීය සභාව විසුරුවා හරින ලද පළාත් පාලන ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු හෙයින්ද;

262 අධිකාරය වන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66 ආ.(4) වගන්තිය සමග කියවිය යුතු 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2(1)(අ) වගන්තිය මගින් දකුණු පළාත් ආණ්ඩුකාරවර ආචාර්ය විලියම් විජේසිංහ ගමගේ වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ 2024.11.04 දින දක්වා වන ධූර කාලය සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් හා අනෙකුත් ලිඛිත නීති මගින් ඇල්පිටිය ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති කාර්යය හා කර්තව්‍ය ඉටු කිරීමටත්, බලතල දැරීමටත් ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ විශේෂ කොමසාරිස් ලෙස බෙන්තොට පතිරණගේ අනුෂා සුජානි ප්‍රියදර්ශනී යන අයව පත් කරමි.

**ආචාර්ය විලියම් විජේසිංහ ගමගේ,**
ආණ්ඩුකාරවර,
දකුණ පළාත.

වර්ෂ 2024 ක් වූ පෙබරවාරි මස 29 වැනි දින,
ගාල්ල,
පහළ ඩික්සන් පාර,
දකුණු පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

EOG 03 - 0017


1A - PG 6663 — 09 (2024/03)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*